# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.03.12 පැය 0855 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out / 492 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>

**01. නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද සිගරට් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2025.03.11 වන දින උදෑසන කාලයේ ඇහැලියගොඩ පොලිස් වසමේ මොරගල ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද සිගරට් 15000 ක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇහැලියගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන කරවිටගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇහැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. වාලම්පුරියක් සමග සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර.**

2025.03.11 වන දින උදෑසන කාලයේ කැකිරාව පොලිස් වසමේ සූරියගම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ටයිටන් වර්ගයේ වාලම්පුරියක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන වැඩිදුර විමර්ශන සඳහා ගනේවල්පොල අඩවි වන ජීවී කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 34 හා 39 යන වයස්වල පසුවන කැකිරාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර.**

2025.03.11 වන දින උදෑසන කාලයේ වාකරේ පොලිස් වසමේ කරුවප්පන්වෙන ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වාකරේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන වාකරේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාකරේ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**04. රක්ෂිත කැලෑවක් එළි කරමින් සිටි සැකකරුවන් හයදෙනෙකු අත්අඩංගුවට - විශේෂ කායර් බලකාය වාකරේ කඳවුර.**

2025.03.11 වන දින උදෑසන කාලයේ වාකරේ පොලිස් වසමේ පනිච්චන්කේනි රක්ෂිත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කායර් බලකා වාකරේ කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර රක්ෂිත කොටසක් එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවන් හයදෙනෙකු අත්අඩංගුවට ගෙන වාලච්චේන අඩවි වන කායර්ාලය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 23 ත් 65 ත් අතර වයස්වල පසුවන වැලිකන්ද හා වාකරේ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**